# පිළිකුත්තුව රජමහා විහාරයේ සිතුවම්වල විශේෂත්වය හා වත්මන් ස්වභාවය පිළිබඳව විමර්ශනයක්

**පබසරා ඊ.කේ.සී.**[1]

ලාංකේය ඉතිහාසයේ යුග ගණනාවක් නියෝජනය කරන්නා වූ පිළිකුත්තුව රජමහා විහාරය පුරාවිද්‍යා ක්ෂේත්‍රය, කටාරම් කොටන ලද ලෙන් විශාල ප්‍රමාණයක් හා සෙල්ලිපි හතරකින් ද සමන්විත වේ. ඉන් කටාරම් කොටන ලද එක් ලෙනෙක් තුළ විහාර මන්දිරය ඉදිකරවා ඇති අතර එහි දක්නට ඇති සිතුවම්වල විශේෂත්වය හා ඒවාහී වත්මන් ස්වභාවය පිළිබඳව විමර්ශණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි. එහිදී සිතුවම් කෙරෙහි හායනකාරක මගින් සිදු වී ඇති බලපෑම පිළිබඳව විමර්ශනය කරන ලදි. ඒ සඳහා ක්‍ෂේත්‍ර ගවේෂණයන්, සම්මුඛ සාකච්ඡා හා සාහිත්‍ය මූලාශ්‍රයන් මගින් දත්ත රැස් කරගන්නා ලදි. මෙම විහාරය 19වන සියවසේ ඉදිකරවා ඇති නමුත් මහනුවර යුගයේ දක්නට ඇති ශෛලීගත සිතුවම් කලාවෙන් බැහැරව යමින් ස්වභාවික ලක්ෂණයන් පෙන්වා දීමට සිතුවම් ශිල්පියා උත්සහගෙන තිබේ. ගසක් වූවද පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවන සේ ඒවාට ආවේණික ලක්ෂණයන් හැකිතාක් හසුකර ගනිමින් සිතුවම් නිර්මාණය කිරීම කෙරෙහි ශිල්පියාගේ අවධානය යොමු වී ඇත. මෙම සිතුවම් තුළ ඇති විශේෂත්වය වන්නේ මෙහි ඇති ඇතැම් සිතුවම්, ලංකාවේ විහාර මන්දිරයක් තුළ දැකගත හැකි එකම ස්ථානය මෙය වීමයි. විහාරය තුළ ඇති ජාතක කතා නිරූපිත සිතුවම් කෙරෙහි පෘතුගීසි වස්ත්‍රාභරණයන්ගේ බලපෑමක් දක්නට ලැබීමෙන් ප්‍රදේශය තුළ සමකාලීනව පැවතියා වූ ජන ජීවිතයේ ස්භාවය මනාව ඉස්මතු වේ. එමෙන්ම විහාරය අභ්‍යන්තරයේ භික්ෂුණීන් වහස්සේලාගේ සිතුවම් කිහිපයක් ද දක්නට ඇති අතර එවැන්නක් දැක ගත හැකි ලංකාවේ එකම ස්ථාන වන්නේ ද පිළිකුත්තුව පුරාවිද්‍යා ක්‍ෂේත්‍රය යි. මෙවැනි වටිනාකම් කිහිපයකින් ම පරිපූර්ණ වූ මෙම විහාරය අභ්‍යයන්තරය හා එහි සිතුවම්; මේ වන විට බොහෝ වශයෙන් විනාශයට ලක්වෙමින් පවතින ආකාරයක් නිරීක්ෂණය වූ අතර එම සිතුවම්වල ආරක්ෂාව සඳහා හෝ එහි දීර්ඝකාලීන පැවැත්ම සඳහා ලබා දී ඇති අවධානය ඉතාමත් අවම මට්මටක පවතින ආකාරයක් ද ප්‍රදර්ශනය විය. වැසි දිය කාන්දුවීමෙන් හා රිලවුන් වැනි සතුන්ගෙන් සිදුවන හානි මෙන්ම සංචාරකයන්ගේ ස්පර්ශයන්ට නිරන්තරයෙන් ගොදුරු වීමෙන් මෙම සිතුවම්වල පැවති මුල් ස්වභාවය පවා වෙනස් වෙමින් යන ආකාරයක් දක්නට ඇති අතර, දීර්ඝ කාලයක් මුළුල්ලේ සිදුවන මෙම තත්ත්වය පාලනය සඳහා කිසිදු පියවරක් නොගෙන තිබීම ද කැපී පෙනුණි. මෙහිදී නිරීක්ෂණයට ලක් වූ සියළු කරුණු අනුව; ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පරිහානියට පත් වී ඇති විශාල වටිනාකම් කිහිපයකින් සමන්විත මෙම පුරාවිද්‍යා ක්‍ෂේත්‍රය, සංරක්ෂණය කළ යුතු පුරාවිද්‍යා භූමියක් ලෙස අවසන් වශයෙන් හඳුනාගත හැකි වූ අතර අධ්‍යයනය අවසානයේ දී, මෙම ක්‍ෂේත්‍රයේ පැවැත්ම සඳහා සුදුසු යෝජනාවලියක් ද සකස් කරන ලදි.

**මුඛ්‍ය පද :** පිළිකුත්තුව, සිතුවම්, විහාරය, වත්මන්, ස්වභාවය

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ekcp1997@gmail.com